# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,130 — 1935ක්වූ ජූනි මස 21 වෙනි දිනවූ සිකුරාද.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාධශනීති.

1920සේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණත.

ගලාවත ආදායම් දිස්ත්‍රික්කයේ අධ්‍යාපන දිස්ත්‍රික් කාය්‍යී සභාව විසින් 1920සේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණතේ 25 (1) වෙනි වගන්තිය යටතේ සම්පාදිතව අධ්‍යාපන සභාව විසින් මැනවැයි පිළිගන්නාලදින් ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් (මේ) ආඥාපණතේ 25 (5) වෙනි වගන්තියෙන් හා 1931සේ ලංකා (රාජ්‍යසභා) රජ සභාවේ නියෝගයේ 93වෙනි වගන්තියෙනුත් උන්වහන්සේ කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර ස්ථිරකරනලද උපනීති.

සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර,
අධ්‍යාපන අමාත්‍යතැන.

1935ක්වූ ජූනි මස 13වෙනි දින කොළඹ
අධ්‍යාපන අමාත්‍යතුමාගේ කාය්‍යීලයේදීය.

### උපනීති.

1. (1) යම් රැස්වීමක් පැවැත්වීමට නියමකර තිබෙන දිනට සතියකට අඩුනැති කාලයකට කලින් ප්‍රධානතුමා විසින් ඒ රැස්වීම පැවැත්වීමට තරම් සෑහෙන කටයුතු නැති බැවින් එය පවත්වන්නේ නැතැයි කියා ලියවිල්ලකින් දැනුම් දුනහොත් හෝ ඒ දැන්වීමෙහි නියමකර තිබෙන වෙනයම් දිනක එය පවත්වන්නේයයි කියා දැනුම්දුනහොත් හෝ මිස නැත්නම් කාය්‍යී සභාවේ සාමාන්‍ය රැස්වීම් පෙබරවාරි, අප්‍රේල්, ජූනි, අගෝස්තු, ඔක්තෝබර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේ තුන්වෙනි වරට යෙදෙන සඳුදා දිනවල පැවැත්විය යුතුයි.

(2) අදහස්කරන කටයුතුවල ස්වභාවය දක්වා තමා විසින් රැස්වීම පැවැත්වීමට නියමකරගත් දිනට සතියකට කලින් සාමාජිකයන්හට ලියවිල්ලකින් දැන්වීමක් භාරකිරීමෙන් විශේෂ රැස්වීමක් පැවැත්වීමට සභාපතිතුමාට පුළුවන.

(3) ප්‍රධානතුමා විසින් එක් එක් රැස්වීමෙහි තොරතුරු පිළිවෙළින් වාර්තා පොතක සටහන්කොට සෑම රැස්වීමකම තොරතුරුවල පිටපතක් ඒ රැස්වීමට පසු හැකිතරම් ඉක්මනින් එක් එක් සාමාජිකයා වෙත යවන්ට සැලැස්විය යුතුයි.

2. (1) ගලාවත නගරබද දිස්ත්‍රික් කාය්‍යී සභාවේ බලය පවත්නා සීමා ඇතුළත පිහිටි ප්‍රදෙශය ඇතුළු ගලාවත මුළු අධ්‍යාපන දිස්ත්‍රික්කය අධ්‍යාපන මණ්ඩලය විසින් පිළිගත් පාඨශාලා මගින් මූලික අධ්‍යාපනයක් ලබාදීම පිණිස හොඳින් විධි විධාන සලස්වා ඇති ප්‍රදෙශයක් හැටියට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(2) මේ උප නීතිවල "පාඨශාලාව" යනුවෙන් අධ්‍යාපන මණ්ඩලය විසින් දැනටමත් පිළිගෙන තිබෙන්නාවූ හෝ මින් පසු පිළිගන්නාවූ මේ දිස්ත්‍රික්කය ඇතුළත තිබෙන පාඨශාලාවලින් කවර එකක් වුවත් අදහස්කරනු ලැබේ.

(3) මේ අධ්‍යාපන දිස්ත්‍රික්කය තුළ—

(a) වයස අවුරුදු 6කට අඩුනුවූ හා 14කට වැඩිනුවූ සෑම පිරිමි ළමයාගේ මව හෝ පියාද,

(b) වයස අවුරුදු 6කට අඩුනුවූ හා 12කට වැඩිනුවූ සෑම ගැහැනු ළමයාගේ මව හෝ පියාද;

ඒ පිරිමි ළමයාගේ හෝ ගැහැනු ළමයාගේ ඉගෙනීම සඳහා තමා විසින් වෙන සෑහෙන විධි විධාන සලසා හෝ අසරණකම හෝ අසනීපකම නිසා ඒ පිරිමි ළමයා හෝ ගැහැනු ළමයා කාය්‍යී සභාවේ ප්‍රධානතුමා විසින් පාඨශාලාවට පැමිණීමෙන් නිදහස් කර හෝ තිබුනොත් මිස නැත්නම් ඒ පිරිමි ළමයාට හෝ ගැහැනු ළමයාට පාඨශාලාවට පැමිණීමට සැලැස්විය යුතුයි:

එහෙත්—

(a) අවුරුදු 10යෙන් ඉහළ මුස්ලිම් හෝ දෙමළ ගැහැනු ළමසින්ට, හෝ

(b) ව්‍යවස්ථා පොතේ 5වෙනි ප්‍රමාණයට නියමිතවූ විභාගයෙන් කියවීම, ලිවීම, (අංක) ගණිතය යන මේ කරුණුවලින් සමත්වූ බවට අධ්‍යාපන මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක මූලාදෘනියකුගෙන් සහතිකපත්‍රයක් දරන්නාවූද ප්‍රධානතුමා මැනවැයි පිළිගනු ලබන විධියේ ප්‍රයොජනවත් කටයුත්තක යෙදී සිටින්නාවූද අවුරුදු දහතරෙන් පහළ නැමතිම පිරිමි ළමයකුට හෝ අවුරුදු දොළහෙන් පහළ නැමතිම ගැහැනු ළමයකුට, හෝ

(c) අවුරුදු අටෙන් පහළ නැමතිම පිරිමි ළමයකුට* හෝ තම ගෙදර හෝ පදිංචි ස්ථානය හැතැප්මකට වැඩිවූ නැමතිම ගැහැනු ළමයකුට හෝ නැමතිම පාඨශාලාවක සිට ඉතාම කිට්ටු පාරෙන් තම ගෙදරට හෝ පදිංචි ස්ථානයට හැතැප්ම දෙකකට වැඩිවූ අවුරුදු අටෙන් ඉහළ නැමතිම පිරිමි ළමයකුට

එසේ පාඨශාලාවට පැමිණීමට බල නොකළ යුතුයි.

### ඉහත සඳහන් උප ලේඛනය.

එලවලු ආදිය ඇතුව වෙළඳපළට ඇතුල්වෙන මෝටර්රථ.

| | රු. | ශ. |
|---|---|---|
| බඩු පටවන හෝ බඩු නිස්කරන ලොරියකට .. | 0 | 25 |
| එම බස්රියකට .. | 0 | 25 |
| එම කාර්එකකට .. | 0 | 15 |

එලවලු ආදිය ඇතුව වෙළඳපළට ඇතුල්වෙන මෝටර් රථ හැර වෙනත් වාහනාදිය.

| | රු. | ශ. |
|---|---|---|
| ගොන්දෙන්නා බඳින බරකරත්තයක් බඩු බෑමට හෝ පැටවීමට .. .. | 0 | 15 |
| තනිගොනා බඳින බාගා බරකරත්තයකට එම .. | 0 | 10 |
| තිරික්කලයක් එම .. | 0 | 6 |

වෙනත්දේ.

| | රු. | ශ. |
|---|---|---|
| මාර්කට්එකේ කඩකාමරවලින් පිටත විකිණීමට තබනලද බඩු කදකට .. .. | 0 | 4 |
| මාර්කට් භූමියේ තබනලද මිනිහෙකු ඔළුව උඩ තබා ගෙන ගෙනෙනලද බරකට .. .. | 0 | 2 |
| කඩකාමරයක විකිණීමට බඩු තැබීමට .. | 0 | 25 * |
| කුකුලන් 12ට වැඩිනොවන ගණනක් සිටින කූඩුවක් මාර්කට් භූමියේ විකිණීමට තබාගත්තොත් .. | 0 | 12 |
| කොයියම් කුරුල්ලෙක් හෝ කුකුලෙක් හෝ කුකුළු පැටියෙක් හෝ මාර්කට් භූමියේ විකිණීමට කූඩුවක තබාගත්තොත් .. .. | 0 | 2 |
| සතෙකු හෝ සතෙකුගේ මලකුනක් හෝ මාර්කට් භූමියේ හෝ කඩකාමරයක හෝ විකිණීමට තැබුවොත් .. .. .. | 0 | 25 |

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 11,420, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1935ක්වූ අගෝස්තු මස 5වෙනි දිනවූ සඳුදා පෙරවරු 10ට කොළඹ ඉඩම් නිරවුල්කරන කන්තෝරුවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝදනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ අන්ගොමුකෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,440. ගම—කනෝයාය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 27 | කපුහේනවත්ත, හිලඳගහ මලුවත්ත යනාදිය | හපුගම පදිංචි විජේලත්පතිරණ්නහැලාගේ දොන් ජේම්ස් විජේරත්න විසින් නිගමුදල් ගෙවානැත | පොල්වත්ත | .. 33 2 12 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒකේ සිතියම කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වෂී 1935ක්වූ ජූනි මස 20වෙනි දින කොළඹ ඉඩම්
පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 11,421, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1935ක්වූ අගෝස්තු මස 6වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 10ට කොළඹ ඉඩම් නිරවුල් කරන කන්තෝරුවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝදනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ උතුරු කටුගම්පොලකෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියම නො. 2,188. ගම—ඉහල ඇලකලාව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 32 | කෝන්ගහමුලහේනේවත්ත නොහොත් ගොඩැල්ල හේනේවත්ත නොහොත් නුගගහමුලහේනේ වත්ත | මිනුවන්ගොඩ බෝරගොඩවත්තේ පදිංචි ලොකුබාල සූරියගේ දොන් හෙන්ද්‍රික් අප්පුහාමි විසින් නියමුදල් ගෙවානැත | පොල්වත්ත | .. 14 2 12 |
| 34 | නුගගහමුලහේනේවත්ත .. | එම .. .. .. | එම | .. 4 3 9 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වෂී 1935ක්වූ ජූනි මස 20වෙනි දින කොළඹ ඉඩම්
පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

**වෂී 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම් :—කොළඹ ටලඹගම පාරේ පිහිටි සමහර ඉඩම්වලින් පාරට අයුවී තිබෙන කෑලිවී නිදහස්කර ගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වෂී 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—**

සිතියමේ නො. A 263. ගම—නාවින්න.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පාර .. | පාරකින් කොටසක් .. | සීමා සහිත කොළඹ කොමර්ෂල් කොම්පැනිය .. | 0 0 28 |
| 2 | කානුව .. | මේසන්වැඩ කරනලද කානුවක් | එම .. .. | 0 0 0·3 |
| 3 | පාර .. | පාරකින් කොටසක් .. | එම .. .. | 0 0 1·5 |
| 4 | එම .. | එම .. | එම .. .. | 0 0 12 |

සිතියමේ නො. A 264. ගම—පන්නිපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පාර .. | පාරකින් කොටසක් .. | ඒ. සී. අබේවඩීන මහත්මයා, පන්නිපිටිය .. | 0 0 2·6 |

සිතියමේ නො. A 478. ගම්—වටරුක සහ ගලගෙදර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පාර .. | පාරකින් කොටසක් .. | කේ. අඩොනිස්අප්පු, කේ. ලීලිස්අප්පු, කේ. කරෝලිස් ගුනවඩීන, ඇල්. ජෝන්සිංඤෝ සහ ඇම්. හෙන්රික් සියල්ලම වටරුක | 0 0 2·3 |
| 2 | එම .. | එම .. .. | එම .. .. | 0 0 9 |
| 3 | එම .. | එම .. .. | එම .. .. | 0 0 3·3 |
| | එම .. | එම .. .. | ජී. සිඤ්ඤප්පු, ජී. දවිත්අප්පු, ජී. බ්‍රම්පිඅප්පු, ජී. කත්‍රිනාහාමි, සහ තවත් වෙනත්අය, සියල්ලම ගලගෙදර | 0 0 17·1 |
| 6 | එම .. | එම .. | සුගතන්සිඤ්ඤෝ, පාදුක්ක .. .. | 0 0 0·9 |

සිතියමේ නො. A 479. ගම—කලුඅග්ගල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | පල්ලියෙවත්ත .. | මුඩුබිම .. .. | රෝමානු කතෝලික කොළඹ බිස්තු උන්නාන්සේ | 0 | 0 | 0·2 |
| 2 | එම .. | එම .. .. | එම .. .. | 0 | 0 | 2 |
| 3 | එම .. | එම .. .. | එම .. .. | 0 | 0 | 0·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ අගෝස්තු මස 2වෙනි දින පෙරවරු 10ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල්ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජුනි මස 18වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඒ. ආර්. මැක්ඩොනල්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ඉන්ගිරියේ ස්ප්‍රිතාලය අහල ප්‍රසිඞ ලිඳක් කැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 493. ගම—ඉන්ගිරිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කරව්වියාකන්දේ පාවුල වත්ත | අවුරුදු 15–20යේ වයස ඇති පොල්ගස් 2ක් සහ ගලෙන් බඳිනලද ලිඳක් ඇති වත්ත | බී. ඒ. ලෙනී සිඤ්ඤො ඉන්ගිරිය .. | 0 | 0 | 4·1 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇතතාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ ජූලි මස 23වෙනි දින පෙරවරු 10.30 කනිසමට ඉන්ගිරියේ ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත්ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජුනි මස 18වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ජේ. ලයිව්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—රඹුක්පිටියේ සෙකොලයකට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හවෙනිකාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 286. ගම—මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම පස්බාගේකෝරළේ පල්ලේ රඹුක්පිටිය.

| නො. | ඉඩමේ නම. | අනුම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ඇල්දෙරවත්ත .. | අවුරුදු 30ක් වයසැති තේ, අවුරුදු 40ක් වයසැති කොස්ගසක්, අවුරුදු 20ක් වයසැති අඹගසක් සහ පුවක්ගසක් සහ මේයෙන්වැඩෙන් කල බිත්ති සහ බෙලෙක් වහලක් ඇති සිරගොඩනැගිල්ලක්ද තිබේ | නාවලපිටියේ බලන්තොට වතු කණ්ඩායමේ සිටින එච්. ඕ. ලෙඩ්බේ | 2 | 1 | 14·3 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ ජූලි මස 15වෙනි දින පස්වරු 2.30යේ කනිසමට රඹුක්පිටියේ සෙකොලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගනනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජූනි මස 11වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩී. සී. ආර්. ගුණවර්ධන,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—සම්මන්තුරපත්තුවේ වීරපතන්හේනේ මිශ්‍ර පාඨශාලාවක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 205. ගම—වීරපතන්හේන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2 | පල්ලියාඩිවලවු .. | එළිමුඩුබිම .. .. | වීරපතන්හේනේ ඇම්. අහමදු ලෙව්වේ | 0 | 0 | 8·4 |
| 3 | තොඩියාඩිවලවු .. | වත්ත, අවුරුදු 12ක් වයසැති දෙඹගසක් හා තාවකාලික මැටිගසපු පැලක් තිබේ | එම ගම අහමදු ලෙබ්බේ මරියන් කන්ඩු | 0 | 0 | 11·8 |
| 4 | පුලියාඩිවලවු .. | වතත, තාවකාලික මැටිගසපු පැලක් හා කොහෙල් පඳුරු ස්වල්පයක්ද තිබේ | එම ගම සුලෙයිමාන් කන්ඩු ආදම්බාවා .. | 0 | 0 | 18·2 |
| 6 | එම .. | එළිමුඩුබිම .. .. | එම ගම අහමදු ලෙව්වේ .. | 0 | 0 | 16·8 |
| 7 | පල්ලියාඩිවලවු .. | වතත, තාවකාලික මැටිගසපු පැලක් හා අවුරුදු 5ක් වයසැති දෙහිගසක්ද තිබේ | එම ගම අයි. සිනිතම්බිගේ කනවැන්දුම් ස්ත්‍රීවන හව්වාකුට්ටි | 0 | 0 | 17·1 |
| 8 | එම .. | එළිමුඩුබිම .. .. | එම .. | 0 | 0 | 3·6 |
| 9 | පුලියාඩිවලවු .. | එම .. .. | එම ගම ඇම්. අහමදු ලෙව්වේ .. | 0 | 0 | 3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතතාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ ජූලි මස 25වෙනි දින පෙරවරු දහයේ කනිසමට ඉරකාමම් ගමේ බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇතතාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජුනි මස 11වෙනි දින
මඩකලපු කච්චේරියේදීය.

සී. සින්නම්පලම්,
මඩකලපුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—නාච්චදූවේ නො. 1 "D" වැනල් රිසර්වේෂන් එකට පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

අසි. ඇස්. පී. පී. සිතියමේ නො. 1. ගම—ගොලුමරදන්කුලම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 69 | — .. | ප්‍රොප්‍රයිටර්ස්වැනල් .. | නාච්චදූවේ පදිංචි ඇම්. මීරා සයිබු පීස් ඔපිසර .. | 0 | 0 | 17·4 |
| 69A | — .. | එම .. | නාච්චදූවේ පදිංචි නාගුරන් අහම්මදු .. | 0 | 0 | 1·5 |
| 69B | — .. | එම .. | නාච්චදූවේ පදිංචි ඇම්. මීරා සයිබු පීස් ඔපිසර .. | 0 | 0 | 13 |
| 70I | අක්කරඉඩං .. | කුඹුර .. | කූසව පදිංචි ඊනා මොයිදීන් .. .. | 0 | 0 | 16·6 |
| 70J | ප්‍රොප්‍රයිටර්ස්වැනල් . | ඇල .. | නාච්චදූවේ පදිංචි ඇම්. මීරා සයිබු පීස් ඔපිසර .. | 0 | 0 | 25·4 |
| 70K | අක්කරඉඩං .. | කුඹුර .. | එම .. .. | 0 | 3 | 3·8 |
| 70L | එම .. | එම .. | එම .. .. | 0 | 1 | 2·6 |
| 70M | එම .. | එම .. | නාච්චදූවේ පදිංචි නාගුරන් අහම්මදු .. | 0 | 0 | 10·2 |
| 70N | එම .. | එම .. | එම .. .. | 0 | 0 | 4·5 |
| 70O | එම .. | එම .. | නාච්චදූවේ පදිංචි ඇම්. මීරා සයිබු පීස් ඔපිසර .. | 0 | 0 | 35·9 |
| 70P | එම .. | එම .. | එම .. .. | 0 | 0 | 12·7 |
| 70Q | එම .. | එම .. | කූසවේ පදිංචි මියන්න නාගුර් උම්මා .. | 0 | 0 | 18·8 |
| | | | | 2 | 0 | 2·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතතාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1935ක්වූ ජුලි මස 16වෙනි දින පෙරවරු 10යේ කණිසමට නාච්චදූවේ සෙක්ලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1935ක්වූ මැයි මස 30වෙනි දින
අනුරාධපුර කච්චේරියේදීය.

ඇල්. ඇල්. හන්ටර්,
උතුරු මධ්‍යම පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—නාච්චදූවේ වැවේ සිට ඇලක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

අසි. ඇස්. පී. පී. සිතියමේ නො. 1. ගම—ගොලුමරදන්කුලම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 70R | අක්කරඉඩං .. | ලොකුකැලෑව .. | ගොලුමරදන්කුලමේ පදිංචි අනා මොහම්මදු කාසිම් .. | 2 | 1 | 35·6 |
| 70A | අක්කරඋකොලගෙඩිම | මුඩුබිම සහ වතුරබහින ඇල | එම .. .. .. | 0 | 3 | 22 |
| 70H | අක්කරඉඩං .. | හේන .. | එම .. .. .. | 0 | 1 | 9 |
| | | | | 3 | 2 | 26·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1935ක්වූ ජුලි මස 16වෙනි දින පෙරවරු 10යේ කණිසමට නාච්චදූවේ සෙක්ලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි,

වර්‍ෂ 1935ක්වූ මැයි මස 30වෙනි දින
අනුරාධපුර කච්චේරියේදීය.

ඇල්. ඇල්. හන්ටර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## මැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීමයි.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක ඉඩම්වල අවුරුද්දක් තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. "Tender for the Right to Gem" එනම් "මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්වි ලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රාතබන ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1935ක්වූ ජූලි මස 17වෙනි දින පෙරවරු 10.30ට වනතුරු භාරගනිමින් කඩාබලනවා ඇත. ඉල්ලීම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්තයෙකු හෝ ඒජන්තවරු ලවා ඉල්ලීම්පත්‍ර හරි ඒවා බව ඔප්පු කරවන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලීම් පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවෙලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට අත්සන්කරවන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාස තුනක් ඇතුළතදී ඉල්ලීම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබානොගත්තොත් නම් ඔහු විසින් ගෙවනලද මුදල රජසන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගු කාලය තුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලැක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලීම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලීම්කාරයෝ තමතමන් ඉල්ලීම්කරණලද ඉඩම්වල වැඩ පටන්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්‍ෂකතුමා වෙත දැන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්‍ෂකතුමා පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්‍ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. වැඩිදුර කාරණ සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

ඉඩම්වල තොරතුරු.

(1) කුරුවිටිකෝරලේ පිහිටි ගැටහැත්තැල්ලේ ගැටහැත්තේ පාලම සිට දම්වැල් 8ක්ප මණ ප්‍රමාණයේ ගියතැන පටන් හිරගේඇල ගැටහැතිඇලට වැටෙන ස්ථානයේ සිට දම්වැල් 4ක් ඉහලට අත්හැර ඒ අතරතුර මෙහි පහත සඳහන් මායිම් තුළ දිගින් හැතැප්ම $\frac{1}{2}$ක් පමණ හරියේවි:—උතුරට: ගැට

හැතිඇලේ ඉතුරු කොටස; නැගෙණහිරට ගැටහැතිඇලේ ඉවුර; දකුණට: ගැටහැතිඇලේ ඉතුරු කොටස; බස්නාහිරට: ගැටහැතිඇලේ ඉවුර.

(2) කුකුළුකෝරළේ පරගල පිහිටි නො. 224 දරන සිතියමේ නො. 194 දරන බිම්කට්ටිය වන අක්කර 5, රූඩ් 3, පර්චස් 32ක් විසාලකම ඇති ගුරුකඩේගේන පාමුති ඉඩමට මායිම්:—උතුරට: නො. 224 දරන සිතියමේ නො. 198 දරන බිම් කට්ටිය; නැගෙණහිරට: නො. 224 දරන සිතියමේ නො. 194A, 194B, 194C, 194D, දරන බිම්කට්ටි; දකුනට: කැස්බෑදෙල; බස්නාහිරට: පරගලගගේ දකුනුඉවුර.

(3) කුරුවිටිකෝරලේ එල්ලාවල ඉහලගම පිහිටි නො. 252 දරන සිතියමේ නො. 310 දරන බිම්කට්ටියේ කොටසක් වන දීගල්ල දික්හේන අක්කර 6ක් පමණ විසාලකම ඇති ඉඩමට මායිම්:—දකුණටද, නැගෙණහිරටද සහ උතුරටද නො. 252කේ නො. 310යේ ඉතුරු කොටස; බස්නාහිරට: දික්දෙනිය.

(4) කුකුළුකෝරළේ ඕබොක්කේගම පිහිටි දිගින් හැතැප් මක්ද පලලින් දම්වැල් 1–1½ක් පමන ඇති කලවානේ ඇලට මායිම්:—උතුරට: රද්දැල්ලේවල; නැගෙනහිරට: නො. 247කේ සිතියමේ නො. 11, 12, 14C, 42, 44, 45 සහ 20A; දකුණට: කලවානේඇල කොස්වත්තේඇලට වැටෙන ස්ථානය; බස්නාහිරට: තපස්සරකන්ද සහ දෙල්ගොඩ ගම් මායිමද සහ නො. 247කේ සිතියමේ නො. 6, 2½ සහ 2.

(5) අටකලන්කෝරළේ බලවින්න පිහිටි දිගින් හැතැප් මක්ද ඇති රක්වානගගට මායිම්:—උතුරට රක්වානගගේ දකුණු ඉවුර; නැගෙනහිරට: බදහමුරේට යන පාර: දකුණට: රක්වානගගේ වම්ඉවුර; බස්නාහිරට: කපුහේන් තැන්නේ අමුන.

(6) නවදුන්කෝරළේ පිහිටි මහාපාන්ඕබය කුඩාපාන්ඕබයට වැටෙන ස්ථානය සිට දිගින් හැතැප්ම ½යක් පමණ තුල මායිම්:—උතුරට: නො. 483කේ සිතියමේ නො. 49; නැගෙනහිරට මහාපාන්ඕබය කුඩා ඕයට වැටෙන ස්ථානය; දකුණට: නො. 483කේ සිතියමේ නො. 11; බස්නාහිරට: ඇල්ල.

(7) කුරුවිටිකෝරළේ මැදගම පිහිටි නො. 351කේ සිතියමේ නො. 37F දරන බිම්කට්ටියේ කොටසක් වන වැහබ මූකලාන, අක්කර 2ක් පමණ විසාලකම ඇති ඉඩමට මායිම්:— උතුරට: මුරුතෙන්ඇල; නැගෙනහිරට: මුරුතෙන්ඇල; දකුණට: පුස්සේදෙල; බස්නාහිරට: වී. පී. 364,487කේ සඳහන් ඉඩම සහ නො. 37F ඉතුරු කොටස.

(8) කුරුවිටිකෝරළේ රත්නුරුගල පිහිටි දිගින් දම්වැල් 40ක් පමණ ඇති මුරුතෙන්ඇලට මායිම්:—උතුරට: රත්ගහ මෝදර; නැගෙණහිරට: මියකිලතැන්න සහ ගල්පොත වෙල;

දකුණට: පුස්සේඇලමෝදර; බස්නාහිරට: වේකඩමූකලාන.

(9) කොලොන්නකෝරළේ පිහිටි රක්වානගගෙ වම්ඉවුරේ ඉඩම් තීරුවක් දම්වැල් 5ක් දිගින්ද සහ දම්වැල් 2ක් පලලින්ද ඇති ඉඩමට මායිම්:—උතුරට: රක්වානගඟ; නැගෙණහිරට: ගඟට අත්හැරපු කොටස; දකුණට: දිසානායකගේ ඉඩම; බස්නාහිරට: ගඟට අත්හැරීය කොටස.

(10) කුරුවිටිකෝරළේ තෙප්පනාව මැදගම පිහිටි නො. 280වේ සිතියමේ ලොට් නො. 200 දරන බිම්කට්ටිය රූඩ් 1, පර්චස් 28ක් විශාලකම ඇති ඉඩමට මායිම්:—උතුරට: නො. 280 සිතියමේ නො. 188; නැගෙණහිරට: එම සිතියමේ නො. 176; දකුණට: එම සිතියමේ නො. 176; බස්නාහිරට: එම සිතියමේ නො. 199.

(11) කුරුවිටිකෝරළේ ගුරුඑවාන පිහිටි දිගින් දම්වැල් 40ක් පමණ ඇති ඉන්දුරුගඟට මායිම්:—උතුරට: ඉන්දුරුගගේ ඉවුර; නැගෙණහිරට: කළුගඟමැටෙන ස්ථානය; දකුණට: ඉන්දුරුගඟගේ ඉවුර; බස්නාහිරට: එළුවාමල ඇලට වැටෙන ස්ථානය.

ඒ. ආර්. හැලොක්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1935ක්වූ ජුනි මස 18වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

---

## සුප්‍රිම් උසාවියේ දැන්වීමයි.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙමසින් ප්‍රකාශකරන්නේනම් රත්නපුර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1935ක්වූ ජූලි මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අර්ත්කඩේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එසින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙසින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඒ. ආර්. හැලොක්,
සබරගමු පළාතේ පිස්කල් උන්නෑන්සේ වෙනුවට.

වර්ෂ 1935ක්වූ ජූනි මස 10වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

---

## අන්‍ය දැන්වීම්.

කුරුවිටිකෝරළේ උඩපත්තුවේ මල්වල පදිංචි කුට්ටිකගෙ විදානෙලාගේ පුංචිමහත්මයා වන මම රත්නපුර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතුකරන නොතාරිස් කෙනෙකු වශයෙන් පත්කරන ලෙස මෙදින සිට තුන්මාසයක් ගතවූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් උන්නාන්සේගෙන් ඉල්ලීමට අදහස්කර තිබෙන බව වර්ෂ 1907 අංක 1 දරණ ආඥාපණතේ 1වෙනි උප ලෙඛනයෙහි B කොටසේ 2 නියෝගයේ ප්‍රකාර මෙසින් ප්‍රකාශකර සිටිමි.

13. 5. 35 K. V. PUNCHIMAHATMAYA,
මල්වල.

---

ගාලු දිස්ත්‍රික්කේ ගඟබඩපත්තුවේ කොරතොද්වල පදිංචි කංකානම්ගමගේ දොන් පීටර් අබයසිරිවර්ධන වන මම ගාලුවත දිස්ත්‍රික්කය තුල සිංහල භාෂාවෙන් ඔප්පු තිරප්පු ආදියෙහි කටයුතුකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට පත්කරණු ලබන පිණිස මෙදින සිට තුන්මාසයක් ගතවූපසු රිජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම් කරණ බව වර්ෂ 1907කේ අංක 1 දරණ ආඥාපණතේ 1වෙනි B කැබලි පත්‍රයේ 2වෙනි නියෝගයේ නියමකර තිබෙන ප්‍රකාර මෙසින් දැනුම්දී සිටිමි.

කේ. ඩී. පී. අබයසිරිවර්ධන,

12 මැයි මස 1935.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.